සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

01. අනුන්ට **උඩගෙඩි දෙන** සිරිදාස ගම්මුන්ගේ අවඥාවට ලක්විය.
(1) ලාභ සත්කාර ගෙන දෙන (2) අසීමිත ව සලකන
(3) බැණ වදින (4) විනාශයක් කරන

02. **එකපතේ කාගෙන** සිටි මිතුරා තම මවට ආසන්න සිද්ධිය හෙළි කළේ ය.
(1) සංග්‍රහශීලී (2) සමසේ බෙදා ගනිමින් (3) සමීප ඇසුරෙන් (4) අරපිරිමැස්මෙන්

03. එම ව්‍යාපෘතිය කරගෙන යන අතර අධ්‍යක්ෂවරයාගේ **කර ඇරීම** කාගේත් විමසුමට ලක් විය.
(1) විරුද්ධ වීම (2) මඟහැරීම
(3) හොඳින් සහාය වීම (4) උපදෙස් දීම

- **අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. විවිධ ජන කොටස්වල .................................................. රටක ජන සමාජය සකස් වේ.
(1) සංකලනයෙන් (2) සහායෙන් (3) සම්මුතියෙන් (4) එකඟත්වයෙන්

05. ඉදිරිපත් කිරීමට නියමිත කාරණය වඩාත් හොඳින් .................................................. කිරීමට වඩාත් උචිත මාධ්‍යයක් තෝරා ගත යුතු ය.
(1) අවධානය (2) අවධාරණය (3) සම්ප්‍රේෂණය (4) නිර්ණය

06. සහෘදයා තුළ චමත්කාරය .................................................. වන පරිදි කරන ලද ලිඛිත නිර්මාණ සාහිත්‍යයට අයත් ය.
(1) ජනනය (2) හීන (3) තක්සේරු (4) ව්‍යාප්ත

07. අකාරාදි පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) විලෝකනය, විශේෂණ, වින්දනය, විමුක්තිය
(2) පුරුෂාර්ථ, පුනරුක්ති, පුහුදුන්, පුදසුන
(3) ආවේගය, ආකාරය, අවාසියි, අවාරය
(4) මානවීය, මාසික, මාහැඟි, මැදහත්

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) නිශ්පාදන, වර්තමාන, තිළිණ ප්‍රදානය, මද්‍යසාර
(2) ළයාන්විත, ජනශුන්‍ය, කණගාටුව, දෘෂ්ටිගෝචර
(3) කාර්යභාරය, ජාතිහිතෛෂී, නෛතික, විස්මයජනක
(4) ප්‍රතිකාර්ය, සමස්තය, ජනගහනය, හසළත්වය

09. එක් එක් වචනයෙහි මුල් අකුරෙහි දීර්ඝ ඇදය, දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, ගැටපිල්ල පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) කාවඩි, සුළඟ, ශාන්ත, බෞද්ධ (2) වැවර, රූපක, නායක, තෘෂ්ණාව
(3) නැවක්, නූපන්, දාරක, ප්‍රෞඪ (4) නෑදෑයෝ, නුදුරෙහි, වැස්ස, මෘදු

10. ''<u>වැව්දිය</u>'' යන වචනය අයත් වන්නේ,

(1) විශේෂණ සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය.

(3) විභක්ති සමාසයට ය. (4) අව්‍ය සමාසයට ය.

11. "මාර්ගෝපදේශකවරු තාක්ෂණික උපකරණ අවභාවිතය නිසා නොමඟ යන දරුවන් සුමඟට ගත්හ.'' මෙම වාක්‍යයෙහි කර්ම පදය වන්නේ,

(1) දරුවන් ය. (2) මාර්ගෝපදේශකවරු ය.

(3) තාක්ෂණික උපකරණ ය. (4) අවභාවිතය ය.

12. ''අත්තෙහි'' යන පදයේ ප්‍රකෘතිය වන්නේ,

(1) අත්තේ (2) අත්ත (3) අත් (4) අතු

13. අපි ගංවතුරෙන් අසරණ වූවන්ට පාසල් උපකරණ බෙදා දුන්නෙමු. මෙම වක්‍යයෙහි "අසරණ වූවන්ට"යන්න අයත් වන විභක්තිය කුමක් ද?

(1) සම්බන්ධ විභක්තිය. (2) ප්‍රථමා විභක්තිය (3) කර්ම විභක්තිය (4) සම්ප්‍රදාන විභක්තිය

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.**

14. බොහෝ දුරට <u>**චිරන්තන**</u> ගද්‍ය සාහිත්‍යයේ භාෂා ශෛලිය විචාරක අවධානයට යොමු වේ.

(1) පුරාතන (2) නූතන (3) අද්‍යතන (4) සාම්ප්‍රදායික

15. එම <u>**අවශේෂවල**</u> ස්වරූපය සැලකිල්ලට ගත් විට මැටියෙන් තැනූ මූර්ති තිබූ බව පැහැදිලි ය.

(1) අඩුපාඩු සහිත කොටස් (2) ඉතිරි වූ කොටස්

(3) අවම කොටස් (4) විසිරුණු කොටස්

16. නිර්මාණකරණයේ නිරත වෙමින් ලබා ගන්නා **ප්‍රාගුණ්‍ය** අගනා නිර්මාණ එළිදැක්වීමට හේතු වේ.

(1) ගණනය කිරීම (2) ප්‍රමාණ කිරීම (3) ප්‍රගුණ කිරීම (4) අත්දැකීම

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) සර්ව නාම - තෝ, මම, නුඹ, මොවුහු (2) තද්ධිත - මාධූර්ය, දූවමය, වාර්ෂික, වකුටු

(3) උපසර්ග - අනු, ඉ, අ, වන් (4) කෘදන්ත - නටන්නා, ලියූ, ගැයීම, සිනාසෙන

18. උක්ත පද දෙකක් ද අනුක්ත පද දෙකක් ද ඇතුළත් වරණය තේරන්න.

(1) තෝ, බමුණෙකු, පර්වතයෝ, දරුවන්

(2) තොප, සතුරන්, ගායිකාවක, සත්තු

(3) වේදනාවෝ, නායකයෙක්, මැණියෝ, අප

(4) නිවේදිකාවක, ඇතෙකු, වීරවරු, රිතීන්

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(1) පැන - ප්‍රශ්න, පතිත - වැටුණු, වුවනත - මුහුණ, කැල - සමූහය,

(2) අනූන - බොහෝ, සාමග්‍රිය - සමගිය, පසරුත් - ප්‍රත්‍යයාර්ථ, නොලසා - ඉක්මනින්

(3) ජන්මලාභය - උපත, ළපලු - ළාදලු, තෙළෙස් - දහතුන, ඉඳු - ස්ථිර

(4) අකෘතඥ - කළගුණ නොදත්, නුනුවණ - දැනුමැති, ශ්වේත - සුදු, පිළිබිහා - වළක්වා

20. දිවේ මුල කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද හඳුන්වන නම කුමක් ද?

(1) කණ්ඨජ (2) දන්තජ (3) ඕෂ්ඨජ (4) තාලුජ

21. විරුද්ධාර්ථවත් පද යුගලයක් <u>**සහිත**</u> වරණය තෝරන්න.

(1) අසාරුප්පය - අකටයුත්ත (2) බහුල - විරල

(3) අනුචිත - නුසුදුසු (4) අවම - අධම

22. ව්‍යාපාර කටයුතු <u>**සරු වී**</u> අධික ලාභ <u>**ලබද්දී**</u> ඔවුහු පින්කම් <u>**කරමින්**</u> ජීවිතය යහපත් <u>**කරගත්හ.**</u>

ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද වර්ග අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) මිශ්‍රක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා

(2) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා

(3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

23. වැරදි අදහස දෙන වාක්‍ය තෝරන්න.
(1) "දික් " ස්වර යනු ගුරු ස්වරවලට කියන තවත් නමකි.
(2) අන්තඃස්ථාක්ෂරයක් වන "ව" අක්ෂරය ඕෂ්ඨජ අක්ෂරයක් ද වේ.
(3) "ගොන්ගේ" යන්නෙහි අර්ථය "හරක් බාන" යන්නයි
(4) දැම්දුරු යනු අව්‍ය සමාසයට උදාහරණයකි
24. ද්විත්ව රූප සන්ධියට උදාහරණයක් නොවන්නේ කුමක් ද?
(1) උග්ගස් (2) වල්ලූරා (3) මුත්තා (4) අනිත්තෙක
25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි කෙටිකතා සංග්‍රහ නාමය තෝරන්න.
(1) රුක්පුනත්තපය (2) තරඅණය (3) පවබජිබ්රත (4) සිනිමිතනොමත
- **අංක 26 , 27 යටතේ දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**
26. බරපතළ අමාරුවක වැටුණා
(1) අලකොළ මීමන කොළ වගෙයි (2) අන්තිම ඉත්තත් අදිනවා
(3) අම්මා දුක් රන්කිරි මතක් වුණා (4) අහසට ඉනිමං බඳිනවා වගෙයි
27. යම් වැඩක් ඕනෑවට එපාවට කරනවා
(1) වැල යන අතට මැස්ස ගහනවා (2) ලෙඩ කපුටො වැල ගිලිනවා වගේ
(3) ලිහා බැලු මල්ල ඔබා බලන්නේ මොනව ද? (4) බල්ලාට ලෙලි පොල් දුන්නා වගේ
28. A අතිශයෝක්ති - අතිශය + උක්ති
B වාලිකාංගණය - වැලිමළුව
C වහල්ලු - හෙන්රි ජයසේන
D සුභාෂිතය - සීතාවක යුගය
ABCD ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ
(1) A හා C පමණි (2) B හා C පමණි (3) A, B හා C පමණි (4) A, B හා D පමණි
- **අංක 29 සහ 30 යන ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**
29. (1) අපි ගුණදහම් රැකිය යුත්තෙමු
(2) අලි ඇතුන් ගමට පැමිණෙතියි ඔවුන් බිය වූහ.
(3) අක්කා යෙහෙළියක සමඟ පාඩම් කළහ.
(4) මව්වරුන් සහ පියවරු ඉදිරි වැඩ පිළිවෙළවල් සම්බන්ධ ව සාකච්ඡා කළහ.
30. (1) බිසව් තොමෝ ස්නානය පිණිස පිටත් වූහ.
(2) ඔවුන් සමඟ මම ද චාරිකාව සඳහා සහභාගි වීමි
(3) අප සියල්ලෝ ම බෞද්ධයෝ වෙති
(4) ළමයි මව්පිය අණට කීකරු නොවන්නේ ඇයි?
31. 1. <u>අනේ</u> පුතුනි, ඔබ ඒ ගමන නොයන්න
2. ඔහු ඒ රහස දැන ගත්තා<u>ලු</u>
3. එදින වැසි දිනයක් <u>නිසා</u> බොහෝ දෙනෙක් පාසලට නොපැමිණියහ.
4. ඔබ <u>නැවත</u> ඒ ගමන යා යුතු ය
ඉහත සඳහන් වාක්‍යවල තද කළු අතුරින් මුද්‍රිත <u>නිපාත</u> පදවල අර්ථය දැක්වෙන අනුපිළිවෙළ කුමක් ද?
A - පුනරාර්ථය B - ශ්‍රැති සුවනාර්ථය
C - භාවාර්ථය D - හේත්වර්ථය
1. C, A, D, B 2. A, D, C, B 3. C, B, D, A 4. B, C, A, D
32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''ඔවුහු ගෙදර යනවිට මං වැට අද්දරට වී බලා සිටියා''
(1) ඔවුන් ගෙදර යද්දී මම වැට අයිනට වී බලා සිටියෙමි.
(2) ඔවුහු ගෙදර යද්දී මම වැට අයිනට වී බලා සිටියහ.
(3) ඔවුහු ගෙදර යද්දී මා වැට අයිනට වී බලා සිටියහ.
(4) ඔවුන් ගෙදර යද්දී මා වැට අයිනට වී බලා සිටියෙමි.

33. මහගම සේකර මහතා විසින් රචනා කරන ලද කෘතියක් නොවන්නේ කුමක් ද?

(1) මක් නිසා ද යත් (2) රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත
(3) සක්වා ලිහිණි (4) කරුමක්කාරයෝ

34. උපමාවක් සහිත කවි පදය තෝරන්න.

(1) විපුල් රත් සෙමර බඳ රන් දද සසල (2) මැණිකෙගෙ මුහුණ දැකුමට පොර කනවාලු
(3) සුරන් තඹුරු පෙති සෙනෙතින් (4) පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වන් අවට

35. මුස්ලිම්වරුන් දෙදෙනෙකු හමු වූ අවස්ථාවක "අතට අත දීමේ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කරගනු ලබන සිරිත සිදුවෙයි. එය හඳුන්වන නාමය වන්නේ

(1) අලෙයිකු මුස්සලාම් (2) මුසාබහා
(3) මූ ආනකා (4) අස්සලාමු අලෙයින්කුම්

36. පහත සඳහන් කවියේ හතරවැනි පදය තෝරන්න.

මැනලා වී දෙකක් නොලැබී මල්ලකට
දරුවොත් එක්ක මම වැටිලා ඉන්නකොට
අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
-------------------------------------------------------------

(1) ඉන්නේ කවුද රැකවරනෙට බැල්මකට (2) නන්නාදුනන මෙනුවර තනි වුණු අපට
(3) චන්දෝ බිළින්දෝ නාඩා නැළවෙන්ට (4) ඇහුවා මගෙ පුතේ කිරි ඕනැද උඹට

37. " සවනක් ගන බුදුරැසින් මුළු ලොව සදමින් වඩුත් වඩුත් සියලු රැසින් සැදෙත් සැදෙත් ගෙයි ගෙයි පිල්සක් විදහා මොනරු නටත් නටත් ...........................................................

මෙම ගද්‍ය කොටස අයත් කෘතියේ කතුවරයා කවුද?

(1) විද්‍යා චක්‍රවර්ති (2) ගුරුළුගෝමී (3) ධර්මසේන හිමි (4) දේව පතිරාජ හිමි

38. පතල් භාෂාවේ "සන්නම්" යනුවෙන් හඳුන්වන්නේ,

(1) ගල් කැට සහිත පස් තට්ටුව ය. (2) ලී තට්ටු ය.
(3) නොවටිනා ගල් ය. (4) ගැරීමෙන් පසු පතුලේ ඉතිරිවන කොටස ය.

39. ළා තඹපත් ලියලන සඳ ළා සුළඟට සැලෙන ළ පලු
දඹ රත්රන් කැටයමක් ය ඇසට කනට ගීතයක් ය
ඒ තඹපත් මෝරන මඳ මී දේ දුව ඉසට නැගුව
පලා පැහැය මහිමයක් ය ඉඳු නිල් මිණි සේසතක් ය

යන කවියෙන් කියවෙන්නේ

(1) පලතුරක් පිළිබඳ ව ය. (2) බෝ ශාකය පිළිබඳ
(3) ස්වරණාභරණයක් පිළිබඳ (4) ඉඳුනිල් මැණික ගැන

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

" පෞරාණික අනුරාධපුර නගරයේ පුරා වස්තු ආරක්ෂා කර ගැනීමත් පූජනීය නගරයක් වශයෙන් එහි ශුද්ධත්වය රැක ගැනීමත් උදෙසා නිවාස, විදුහල්, වෙළඳපළවල්, අන්‍යාගමික ගොඩනැගිලි ආදිය ශුද්ධ නගරයෙන් ඉවත් කොට නවීන නාගරික වුවමනාවන් පිරිමසාලන නව නගරයක් මල්වතු ඔයේ නැගෙනහිර ඉවුරෙහි ගොඩනගා තිබේ.

(1) අනුරාධපුර නගරයේ සාදා තිබූ නිවාස, විදුහල්, වෙළඳපළවල්, අන්‍යාගමික ගොඩනැගිලි ඉන් ඉවත් කර මල්වතු ඔයේ නැගෙනහිර ඉවුරෙහි ඒවා නැවත ඉදිකර තිබේ.
(2) පෞරාණික අනුරාධපුර නගරයේ ඓතිහාසික වටිනාකම ආරක්ෂා කර ගැනීමට හැකි වී ඇත්තේ එහි තිබූ නවීන නාගරික ගොඩනැගිලි ඉන් ඉවත්කර වෙනත් තැනකට ගෙනයාම නිසාය.
(3) පෞරාණික නගරවල පුරාවස්තු ආරක්ෂා කර ගැනීමෙන් පූජනීය නගරයක් වශයෙන් ශුද්ධත්වය ආරක්ෂා කර ගැනීමටත් නිවාස, විදුහල් වෙළඳපලවල් අන්‍යාගමික ගොඩනැගිලි ශුද්ධ නගරයේ ඉවත් කළ යුතු ය.
(4) අනුරාධපුර නගරයේ පුරාවස්තු ආරක්ෂා කර ගැනීමටත් පූජනීය නගරයක් ලෙස රැකගැනීමෙන් නාගරික වුවමනාවන් පිරිමසාලන නිවාස, විදුහල්, වෙළඳපළවල්, අන්‍යාගමික ගොඩනැගිලි ශුද්ධ නගරයෙන් ඉවත් කර මල්වතු ඔය අසල ඉදිකර තිබේ.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

- අංක **(i)** සිට **(x)** දක්වා ඇති සියලු ම ප්‍රශ්න සඳහා කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) සිංහල හෝඩියේ ඇතුළත්

(අ) විසර්ජනීය (ආ) අනුස්වාරය

යන අක්ෂර ලියන්න.

(ii) පහත පද සන්ධි කර ලියන්න.

(අ) නැවි + ආට (ආ) අත් + ලස්

(iii) පහත වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.

අවස්ථෝචිත උපමා බාවිතා කිරීම ද රිද්මයානුකුල පද සංඝටනය ද පැරණි කවිවල බොහෝ විට දැකිය හැකි ලක්ෂණයකි.

(iv) පහත පද්‍ය පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**බඩ** වක පිට වක **සත්** වැරටිල්ලා
දෙපටට **කුදු** ගැසි වකට කුදුල්ලා

(v) පහත වාක්‍යයේ ඇතුළත් උපසර්ග දෙක උපුටා ලියන්න.

මහ වනයේ ඇති හොඳින් වැඩුණු සුවිශාල වෘක්ෂයෝ සොබා දහමට නිහඬ මෙහෙයක් සිදු කරති.

(vi) පරිමිත භාෂාවල එන පහත පදවල අර්ථ ලියන්න.

(අ) බුඩා (ආ) කුටාලම

(vii) පහත වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.

(අ) ශිෂ්‍යයෝ ශිෂ්‍යාවෝ සමඟ තරඟ වදිති

(ආ) අධ්‍යක්ෂවරයා නොහොත් නියෝජිතවරිය රැස්වීමට සහභාගි වන්නේ ය.

(viii) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) නර්තන ශිල්පීහු විශිෂ්ට නර්තන අංගයකින් සභාව පිනවති

(ආ) ඔවුහු එදින මා අධිකරණය වෙත කැඳවූහ.

(ix) පහත වාක්‍යයේ තද කළු අකුරින් දී ඇති පදවල විභක්තිය නම් කරන්න.

**උපාසිකාව විලෙන්** නෙළුම්මල් නෙළා **පුදසුන** මත පුදයි.

(x) පහත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කරන්න.

(අ) නැටුම් (2) පොඩිති (ලකුණු $2 \times 10 = 20$)

02 පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ජාතික හා ජාත්‍යන්තර සමගිය පිළිබඳ ව අද ලෝක ප්‍රජාවගේ අවධානය යොමු වී ඇත. ජාතික සමගිය ඇති කිරීමේ මූලික පියවර වන්නේ පවුලේ සමගිය ඇති කිරීමයි. නමුත් අද බොහෝ පවුල් තුළ පවා සමගියක් ඇති බවක් නොපෙනේ. දෙමවුපිය - දූදරු සබඳතා දුරස්ථ වී පවතී තරගකාරී ආර්ථික හා සමාජ රටාව තුළ එදා මෙන් දෙමාපියන් හා දරුවන් අතර සුහද ව කතා කිරීමේ අවස්ථාව ගිලිහී ඇත. ජාතික සමගිය කරා යන ගමනේ දී පවුලේ සමගිය රඳවා ගැනීම උදෙසා දෙමාපියන්ගේත් දරුවන්ගේත් කාර්යභාරය ඉතා විශාලය.

(ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිවල කඩිනම් සංවර්ධනයක් දක්නට ලැබේ. අධිවේගී මාර්ග තැනීම, අබලන් මාර්ග ප්‍රතිසංස්කරණය මෙහි දී වැදගත් වේ.

නමුත් දිනෙන් දින ඉහළ යන රිය අනතුරුවලට හේතුව මෙකී සංවර්ධනය බවට සමහරු මැසිවිලි නගති. එහෙත් සමහරුන්ගේ මතය අබලන් මාර්ග නිසා රිය අනතුරු සිදු වන බවයි. රියදුරන්ගේ නොසැලකිලිමත්කම ඇතුළු බොහෝ රිය අනතුරුවලට හේතු වෙයි. විනයගරුක රියදුරන් බිහි කිරීමට අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

(ඇ) විනයගරුක සංමයෙන් යුතු, නිරෝගී මිනිසුන් බිහි කිරීමට ක්‍රීඩාව තුළින් ලැබෙන්නේ මහත් පිටු බලයකි. පෙරපාසල් වියේ පටන් ක්‍රියාශීලී දරුවන් තැනීමට විවිධ ක්‍රියාකාරකම් හා වැඩ සටහන් සකස් කළ යුතු ය. ඒවා ලියකියවිලිවලට පමණක් සීමා නොකර ක්‍රියාත්මක කරමින් අදාළ අරමුණු ඉටු කර ගැනෙන පරිදි යොදා ගත යුතු ය. පාසල ඊට හොඳ ම තෝතැන්න වේ. විනෝදාස්වාදය ලැබීමට පමණක් ක්‍රීඩාව යොදා නොගතයුතු ය.

(ඈ) අපි ස්වාභාවික විපත් පිළිබඳ ව නිතර කතා කරන අවධියක සිටිමු. ඒවාට අදාළ හේතු කාරණා දිගින් දිගට සාකච්ඡාවට බඳුන් වුව ද මිනිසා තවමත් ස්වභාව ධර්මයට එරෙහිව කටයුතු කරයි. මෙවන් වකවානුවක ආපදා කළමනාකරණය පිළිබඳ අවධානය යොමු වීම අත්‍යවශ්‍ය කරුණකි.

(ලකුණු 25)

03 පහත දැක්වෙන පාඨය වචන 60 - 70 අතර වන සේ සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

" පාසල් ජීවිතයෙන් පසු පුද්ගලයෙකු පිවිසෙන්නේ වඩා සංකීර්ණවූත් ගැටලු සහිතවූත් පොදු සමාජයට හෙවත් සැබෑ ජීවිතයටයි. එහි දී ගෙදරදීත් පාසලේදීත් ගත කළ ජිවිතයට වඩා වෙනස් දුෂ්කර තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වෙයි. තමාට වඩා උගතුන් ද නූගතුන් ද වැඩිහිටියන් ද බාලයන් ද දුප්පතුන් ද පොහොසතුන් ද ආදී විවිධ තරාතිරම්වල පුද්ගලයන් සමඟ කටයුතු කිරීමට සිදු වේ. ඔවුනගේ සිතුම් පැතුම් හා හැසිරීම් ද අමුතු ය. මේ හැම දෙනා සමග එක්ව ජීවත් වීමට ගන්නා උත්සාහයේ දී පෞද්ගලිකත්වයට විවිධ ගුණාංග රාශියක් එකතු වෙයි.

විවිධ ස්ථාන අවස්ථා සිද්ධි හා පුද්ගලයන් සමග උචිත ලෙස හැසිරීමටත් පරිසරයට වහල් නො වී මධ්‍යස්ථ ව යහපත අයහපත විනිශ්චය කර ගැනීමටත් තරම් මේරූ තත්ත්වයකින් සමාජයට එන පුද්ගලයෙකුට සමාජය ප්‍රියමනාප තැනක් කොටගෙන, යහතින් ජීවත් වෙමින් තම ස්වීයත්වය පරිණතියට පත්කර ගැනීමට නො හැකි වෙයි. නො එසේ ම නො මේරූ තත්ත්වයෙන් එන පුද්ගලයාට සමාජය තේරුම් ගත නො හැකි ව විවිධ බල වේගයන් සමග ඒ මේ අතට ඇදී යන්නට සිදු වී පරිසරයේ ගිලී යන්නටත්, අතරමංවීමටත්, සමාජ විරෝධියකු වන්නටත් සිදු වනු නො වැළැක්විය හැකි ය. පොදු සමාජය දෙස බලන විට බොහෝ වැඩිහිටියන් පවා ළමයින් මෙන් බොළඳ ලෙස හැසිරෙන අවස්ථා දක්නට ලැබෙනුයේ ඔවුනගේ පෞරුෂත්ව වර්ධනය වී නැති හෙයිනි. සැකෙවින් කියතොත් පොදු සමාජයේ උචිත හැසිරීම් දැක්වීමට හැකිවීම පරිණත ස්වීයත්වය ලෙස හැඳින්විය හැකි ය.”

(ලකුණු 10)

04 පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

" මිනිසා මුල් යුගයේ දී ලෝහ ආයුධ නිපදවා ගත්තේ උල් කළ ගල් කැබලි ආදියෙන් දඩයම් කිරීමේ දී මතු වූ ගැටලුවලට පිළියමක් වශයෙනි. ලෝක යුද්ධයේ අභියෝගය ඉදිරියේ ඔහු ගුවන් නැව, පරමාණු බෝම්බය වැනි දෑ නිපදවීය. අධ්‍යාපන තාක්ෂණය විෂය සම්බන්ධයෙන් ද ඉහත සඳහන් කළ සිද්ධාන්තය ම සත්‍යයක් වශයෙන් වලංගු වෙයි. මිනිසා නවදැනුම හා ක්‍රමවේද සොයා යාමට පෙළඹෙන්නේ ඔහුට මුහුණ පෑමට සිදු වූ යම් යම් අභියෝගයනට පිළියම් වශයෙනි. අධ්‍යාපන තාක්ෂණය බිහි වූයේ ද තත්කාලීන සමාජ අවශ්‍යතා ප්‍රමාණවත් අන්දමින් සපුරාලීමට සාම්ප්‍රදායික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය තුළ ගොනු වී පැවති දැනුම ප්‍රමාණවත් නොවූ හෙයිනි. අනුරාධපුර හෝ පොළොන්නරු යුගයේ ශිෂ්‍යයකු විසින් ලද අධ්‍යාපනය වත්මන් යුගයේ සමාජ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් හෝ අදාළ හෝ නොවේ. ජීවිතය යනු නිරන්තර පරිණාම ක්‍රියාවලියක එක් අංගයක් පමණකි. එහෙයින් එය සෑම විට ම වෙනස් වෙමින් අඛණ්ඩ ප්‍රවාහයක් මෙන් කාලය ඔස්සේ ගලා බසිමින් පවතී. මේ නිසා පවත්නා දැනුම හා ශිල්පීය ක්‍රම යල් පැන යාමත්, නව දැනුම ඉපයීමත් නිරතුරු ව සිදුවෙමින් පවතී."

(i) අධ්‍යාපන තාක්ෂණය බිහි වූයේ ඇයි?

(ii) නොකඩවා ම සිදු වන තත්ත්වයන් දෙකක් ලෙස මෙහි දක්වා ඇත්තේ මොනවා ද?

(iii) මිනිසා ලෝහ ආයුධ නිෂ්පාදනය කෙරෙහි යොමු වූණේ ඇයි?

(iv) ජීවිතය පිළිබඳව මෙහි දක්වා ඇති අර්ථකථනය කුමක් ද?

(v) ලෝක යුද්ධය අභියෝගයක් වූ තැන්හි මිනිසා විසින් නිෂ්පාදිත මෙවලම් දෙකක් ලෙස මෙහි දක්වා ඇත්තේ මොනවා ද? (ල. 10)

05. විවිධ හේතු නිසා ඇති වී තිබෙන වකුගඩු රෝගය සම්බන්ධයෙන් ජනතා අවධානය යොමු කරලීම පිණිස " වකුගඩු රෝග නිවාරණ බලකාය" මගින් නිකුත් කෙරෙන අත්පත්‍රිකාවක් පිළියෙල කරන්න.

නැතහොත්

ආසන්න දිනයක දී තිස්සවැව ප්‍රදේශයේ ඇති වූ සුළිසුළං තත්ත්වයක් හේතුවෙන් නිවාස 200 කට පමණ හානි සිදු විය. ඒ හේතුවෙන් ප්‍රදේශවාසීන් ලක්ව ඇත්තේ දැඩි දුෂ්කරතාවන් ට ය. ඒවා විස්තර කරමින් ඉක්මනින් සහන සලස්වන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන නිළධාරීන් වෙත යැවෙන ලිපිය ලියන්න.

ඔබ තිස්ස වැව ප්‍රදේශයේ ප්‍රගති සමාජ සේවා සමිතියේ ලේකම් ඩබ්. ඒ. සුනිල් ජයරත්න ලෙස සලකන්න.

(ල. 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලිය වූ යුගය කුමක් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොත සිංහලයට නගා ඇත්තේ කුමන අයෙකුගේ අනුග්‍රහයෙන් ද?

(ii) මා කී දේ දෙයියනි බොරුවක්ම නැති
බිම එළි වුණොත් කණු මදු බොහොම ළඟ ඇති
ඇහැට වෙහෙස ඇති තුන්යමට නිදි නැති
.................................................................................
(අ) ඉහත පද්‍යයේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවිය කුමන ජනකවි වර්ගයට අයත් ද?

(iii) (අ) සැළලිහිණි සන්දේශයෙහි රචකයා නම් කරන්න.
(ආ) සිංහල සාහිත්‍ය වංශයෙහි දක්නට ඇති පැරණිම සන්දේශ කාව්‍ය කුමක් ද?

(iv) " ංහ් ! එයාට විතරක් මොක ද? මමත් හෙට යනවා"
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) කේ. ජයතිලකයන්ගේ මුල්ම කෙටි කතා සංග්‍රහය නම් කරන්න.

(v) දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණයනැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ.
(අ) මෙම පද්‍ය නිර්මාණය ඇතුළත් පද්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) එම පද්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.

(vi) (අ) " අඟුල්මල් දමනය" පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය රචනා කළ යුගය කුමක් ද?

(vii) "ඔව්, ඔයාට ඒක තේරුණේ නෑ. නේද? ආයි ඇරලා නෑ දෙකම එක වගේමයි.
(අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කා විසින් ද?
(ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් මුල් කෘතියේ කතුවරයා නම් කරන්න.

(viii) වැහි වලාකුළු රංචු කඳු මුඳුන්වල ලගින
දන් ඒවි තැනි බිමට සීතල යි මගෙ සිතට
වැසි සමේ රෑ ඇඳේ සිහිනයන් වී ඉන්න
ඔබ එන්න - ඉතින් මගෙ හෙට දවස මට දෙන්න.
(අ) ඉහත සඳහන් පද්‍ය කොටස උපුටාගත් පද්‍ය පන්තියේ නම ලියන්න.
(ආ) මෙම පද්‍ය නිර්මාණය කළ ගීත රචකයාගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය කුමක් ද?

(ix) ''පුත තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නොවෙයි.''
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම මුල් කෘතිය ලිවීමට පාදක කරගත් ග්‍රන්ථය කුමක් ද?

(x) පහත සඳහන් කෘතින් හි කතුවරු නම් කරන්න.
(අ) සියබස්ලකර -
(ආ) බුත්සරණ - (ලකුණු 2 x 10 = 20)

02 පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) රුති වනපෙති නැවිදින් සුමුවෝයා
නිති මියුරුති වෙණ නදළමුයෝය
සිතිවිලි නැති රූ විලස මුවෝය
තැති නොගනිති මිනිසුන් සමුවෝයා

(අ) තදකළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මුළු කවියේම අර්ථය ලියන්න.

(ii) ඉක්බිතිව උඩුගලේ පිටතට නෙරාගිය තැනකට සවිකර ඇති අත අක්කාත් මාත් අල්ලාගෙන ගල කරකවමු. එවිට කුරක්කන් ඇඹරී සුදුපාට වැස්සක් මෙන් ගල වටේ හැළී යයි.

(අ) මෙම පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.
(ආ) ඉහත සඳහන් පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) කස්තුරි තිලක සැදී නළලත සුමටාන
පුල් මහනෙල් මල්දම් හිස දවටාන
සලෙළුන් යනෙන නිති කැරැ කෙළි කවටාන
රිවි මුදුනත වන මැද වඩු සුමුටාන

(අ) අංකික පදවල අර්ථය ලියන්න.
(ආ) කවියේ අර්ථය සරල බසින් ලියන්න.

(iv) සබඳ, තොප විසින් කුමක් දක්නා ලද ද, කුමක් අසන ලද ද යි විචාළ සේක.

(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කාහට ද?
(ආ) මෙම ප්‍රකාශය සඳහා ලැබෙන පිළිතුර කුමක් ද?

(v) තුමුල ගතින් දා
බාහු බෙලෙන්දා
වෙමි සේ තිදසින් දා
කුරිරු ගිජින්දා
කුඹු තල සින්දා
ලමි සේ කෙසරින්දා

(අ) ඉහත පද්‍ය කොටසේ සිංහයා සඳහා යොදා ඇති උපමාව කුමක් ද?
(ආ) මෙම කොටසේ සමස්ත අර්ථය ලියන්න. (ලකුණු 4 x 5 = 20)

03 (i) එක් සියයක් රජ දරුවන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමටත්,
(ii) වෛදේහ රජුත්, වෛදේහ රාජ්‍යයත්, ආරක්ෂා කර ගැනීමටත්, මහෞෂධ පඬිතුමා ක්‍රියාකළ ආකාරය නිර්දිෂ්ට පාඩමෙන් උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

<u>නැතහොත්</u>

" හානාහීය පානා අඬ හැරෙන් දූනේ" ජනකවි පෙළෙන්,
(i) ජීවිත ගැටලුවලට වැදගත් වන උපදේශ ලබා දීමත්,
(ii) ජනතාවගේ සදාචාර සංවර්ධනයත් අරමුණ වී ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් පිළිතුරු සපයන්න.

04 බැද්දේගම කතුවරයා කතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණයේදී,
(i) සංවාද ආකෘතිය සාර්ථකව යොදා ගෙන ඇති ආකාරයත්,
(ii) චරිත කෙරේ දයානුකම්පාවක්, ඇතිවන අයුරින් උපමා උපමේයන් ගෙන් සරසා ඇති අයුරුත් ප්‍රශස්තය.
නිර්දිෂ්ට පාඩමින් එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

<u>නැතහොත්</u>

(i) වැසිකිළිය තැනීමේ කටයුත්ත සෞඛ්‍ය පරීක්ෂකතුමා ජය ගන්නා අතර,
(ii) එය භාවිත කිරීමේ ජයග්‍රහණය ලබන්නේ කථකයායි.
" අපට වැසිකිළියක්" කෙටිකතාව ඇසුරින් එක් කොටසකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

- **අංක 05, 06, 07 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

05 මැටිල්ඩා ලොයිසල් මහත්මිය සාමාන්‍ය පංතියේ සමාජ පසු තලයක ඉපිද, ඉහළ ජීවන රටාවක් අපේක්ෂාවෙන් සිහින මැවූ කෙනෙකි. නිර්දිෂ්ට කෙටි කතාවෙන් උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.

06 හුලං දා ඔයට ජීවය පිඹින කවියා ඒ සඳහා පරිසරයේ ඇති වූ පිබිදීම එක්කර ගනී. වස්සාන සමයෙහි බලපෑම කවියා වර්ණනයට හසු කරන අයුරු උදාහරණ තුනක් දෙමින් සාකච්ඡා කරන්න.

07 " දෑතේ කරගැට සිඹසනසන්නට " පද්‍ය නිර්මාණයේ උපයුක්ත භාෂාව නිර්මාණය රසවත් කිරීමට දායක වූ ආකාරය උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ල. 15 යි)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (4) | 11 - (1) | 21 - (2) | 31 - (3) |
| 2 - (3) | 12 - (4) | 22 - (3) | 32 - (1) |
| 3 - (2) | 13 - (4) | 23 - (4) | 33 - (4) |
| 4 - (1) | 14 - (1) | 24 - (1) | 34 - (3) |
| 5 - (3) | 15 - (2) | 25 - (3) | 35 - (2) |
| 6 - (1) | 16 - (3) | 26 - (3) | 36 - (4) |
| 7 - (4) | 17 - (3) | 27 - (2) | 37 - (1) |
| 8 - (3) | 18 - (1) | 28 - (4) | 38 - (3) |
| 9 - (2) | 19 - (4) | 29 - (1) | 39 - (2) |
| 10 - (3) | 20 - (1) | 30 - (2) | 40 - (4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01 (i) (අ) (ඇ)
(ආ) (ඈ)

(ii) (අ) නැවියාට (ආ) අල්ලස්

(iii) භාවිත
රිද්මානුකූල

(iv) සත් - සම
වැරටිල්ලා - වියළි ගොම කැබලි

(v) සුවිශාල , නිහඬ

(vi) බුඬා - වයසක මිනිසා
කුටානම - වී මැනීමට භාවිත කළ උපකරණය

(vii) (අ) ශිෂ්‍යයෝ ශිෂ්‍යාවන් සමඟ තරග වදිති
(ආ) අධ්‍යක්ෂවරයා නොහොත් නියෝජිතවරිය රැස්වීමට සහභාගි වන්නී ය.

(viii) (අ) නර්තන ශිල්පීන් විසින් විශිෂ්ට නර්තන අංගයකින් සභාව පිනවෙයි / පිනවනු ලබයි / පිනවනු ලැබෙයි
(ආ) ඔවුන් විසින් එදින මම අධිකරණය වෙත කැඳවුණෙමි / කැඳවනු ලැබුවෙමි / කැඳවන ලදිමි.

(ix) උපාසිකාව - ප්‍රථමා විභක්ති / විලෙන් - අවධි විභක්ති

(x) නැටුම් - නට + උම් / පොඩිති - පොඩි + ඉති (ලකුණු 2 x 10 = 20)

02 රචනය

| | | | |
|---|---|---|---|
| (i) | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | - | ලකුණු 08 |
| (ii) | සංවිධානය, නිර්මාණාත්මක බව, ස්වීයත්වය | - | ලකුණු 12 |
| (iii) | ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදීම | - | ලකුණු 05 |
| | | | මුළු ලකුණු 25 යි. |

03 සාරාංශය

අන්තර්ගතය ලකුණු 06 යි.
වචන ගණන ලකුණු 02 යි.
ශිල්ප දක්ෂතා ලකුණු 2 යි. මුළු ලකුණු 10 යි.

04 (i) තත්කාලීන සමාජ අවශ්‍යතා ප්‍රමාණවත් අන්දමින් සපුරාලීමට සාම්ප්‍රදායික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය තුළ ගොනු වී පැවති දැනුම ප්‍රමාණවත් නොවූ නිසා.

(ii) ⋆ පවත්නා දැනුම හා ශිල්පීය ක්‍රම යල් පැන යාම ⋆ නව දැනුම ඉපයීම

(iii) උල් කළ ගල් කැබලි ආදියෙන් දඩයම් කිරීමේ දී මතු වූ ගැටලු වලට පිළියමක් වශයෙනි.

(iv) නිරන්තර පරිණාම ක්‍රියාවලියක එක් අංගයක් පමණකි.

(v) ⋆ ගුවන් නැව ⋆ පරමාණු බෝම්බය (ලකුණු 2 x 5 = 10)

05 අත්පත්‍රිකාව / ලිපිය

| | |
|---|---|
| ආකෘතිය | ලකුණු 05 යි. |
| අන්තර්ගතය | ලකුණු 07 යි. |
| ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |
| | මුළු ලකුණු 15 යි. |

# III කොටස

01 (i) (අ) කුරුණෑගල (ආ) වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයාගේ

(ii) (අ) ගොබකළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති (ආ) කුරක්කන් කවි

(iii) (අ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (ආ) මයුර සන්දේශය

(iv) (අ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා

(ආ) පුනරුත්පත්තිය සහ තවත් කෙටි කතා

(v) (අ) ප්‍රබුද්ධ (ආ) මහගමසේකර මහතා

(vi) (අ) අමාවතුර

(ආ) පොළොන්නරුව

(vii) (අ) මැටිල්ඩා (ආ) ගීදමෝපසාං

(viii) (අ) වස්සානය (ආ) බිය නොවන් අයියණ්ඩි

(ix) (අ) සද්ධර්මරත්නාවලිය (ආ) පාලි ධම්මපදට්ඨ කතාව

(x) (අ) සිව්වන සේන රජතුමා

(ආ) විද්‍යාචක්‍රවර්ති (ල. 2 × 10 = 20)

02 (i) (අ) සුමුමෝයා - රිළවු / වඳුරො / මුවරංචු / සමූහ

සමුවෝයා - හමුව / සම්මුඛව

(ආ) සිත්කලු වනපෙතින් රංචු පිටින් පැමිණ නිරන්තර මිහිරි බව ඇති වීණා නාදයට අරිනා ලද මුඛය ඇති මුවෝ සිතිවිලි නැති රූප විලස මිනිසුන් හමු ව බියපත් නො වෙති.

(ii) (අ) සුදුපාට වැස්සක් මෙන්

(ආ) තාත්තගේ බැණ වැදීමෙන් පසුව මල්ලී (කථකයා) අක්කාත් සමග කුරක්කන් අඹරන ලද අවස්ථාව හා සම්බන්ධය.

(iii) (අ) සුමටාන - මටසිලිටි, සුමුදු

කෙළි කවටාන - කෙළි කවටකම්

(ආ) ඉතා මටසිලිටි නළලෙහි මුව වර්ගයකින් ලබා ගන්නා කස්තූරි නමැති ඖෂධයෙන් තිලකයක් තබාගෙන සිටින විනෝදකාමී තරුණයන් පිපුණ මහනෙල් මල් මාල හිසෙහි දවටාගෙන කෙළි කවටකම් කරමින් නිතර එහා මෙහා යමින් එමින් සිටින සුමුටාන නමින් හඳුන්වනු ලබන කැලෑ ප්‍රදේශය මැදට හිරු මුදුන්වන වේලාවේ දී යන්න.

(iv) (අ) මහෞෂධ පඬිතුමා විසින් ගිරාපෝතකයාට

(ආ) සියලු දඹදිව අනෙක් රජවරුන් කෙරෙහි භයක් නොමැති බවත්, චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ කේවට්ට පුරෝහිතයාණන් මඟුල් සල් උයනේ දී සතරකන් මන්ත්‍රණයක් කළ බවත් කියා සිටියේ ය.

(v) (අ) තිදසින්ද්‍රා / ශක්‍රයා

(ආ) මාපිය සිංහයා, ශක්තිමත් ශරීරයකින් හා බාහුබලයක් ඇති ශක්‍රයා බඳුය. නපුරු ඇත් රජකුගේ කුම්භස්ථල සිඳිය හැකි ඔහු සිංහරාජයකි. (ල. 4 ×5= 20)

03 (i)

- " කේවට්ටයා මා මහෞෂධ පණ්ඩිත බව නොදනිති'යි සිතම්" සිතා සිය ප්‍රඥා බලය දිග හරින්නට විය.
- "ජය පානය බොන දවස් නියම කොට කියා එවවු" යයි අන්තස්සරා පුරුෂයන්ට හසුන් යැවූහ.
- "මාබඳු පණ්ඩිත කෙනෙකුත් ජීවත්ව සිටිය දී මෙතෙක් රජ දරුවන් මියයාම යුක්ත නොවන්නේය.
- චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවක් හිඳිනට පැනවූ අස්සනට ඉක්බිති පැන වූ මා හැඟි අස්සනක් අපගේ රජ්ජුරුවන්ට යැයි ගෙන........
- කළහ වඩාගෙන මස් අවුළු ආදිය කෑ නොදෙමියයි. යෝධයන් දහස යැවූහ.

(ii)

★ ඒ අසා මහබෝසතාණෝ වඩාලාම කළමනා විධානයෙ නොපමා වූ සේක.

★ බෝධිසත්වයන්ගේ යෝධයෝ බ්‍රහ්මදත්තයන්ගේ යෝධයනයට අතින් මුහුණින් උසුළු පෑ නොයෙක් ආකාරයෙන් ගහට කරන්නාහ.

- ★ යළි බ්‍රහ්මදත්ත ආවැනැයි සී මැදුරු කවුළුව හරවා පිටත බලන්නහ......... ඉක්බිති අපගේ දිවි නැති බ්‍රහ්මදත්තයා තෙමේ දන් අපසැට මරන්නේය. වේදේහ රජ වැළපීය.
- ★ මහ බෝසතාණන් චූලනි බ්‍රහ්මදත්ත රජ ආබවදන සිංහයෙකු මෙන් කිපී බියක් නැතිව නුවර මුළුල්ලෙහි රැකවල් සකස්කොට ලවා........
- ★ ම'පුතණුවන් මහෞෂධ පණ්ඩිතයන් විනා අනෙක් මා මේ දුකින් මුදන්නට සමර්ථ කෙනෙක් නැතැයි.

<u>නැතහොත්</u>

(i) ★ පුද්ගල ක්‍රියාකාරිත්වයන් හිදී ප්‍රායෝගික ඥානය අත්‍යවශ්‍ය බව කීමට දී ඇති උපදේශය

- ★ "ගසට කෙටුම ගස මුල පැයුමෙන් දනේ"
- ★ "පනින රිලවුන්ට ඉනිමං කමක් නැත"
- ★ "ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු"

(ii) ■ "වරද පෙනෙන තරමට වැරදුණා නොවේ"

- ■ එක් වුණදාට උක් දණ්ඩේ පැණිසේමා
- ■ රන්විමනේ සිටිමුත් දුක නැති වේද්ද
- ■ අඳුරු කරුවලේ පඳුරට මුවාවෙලා

04\. (i) ● පුංචි මැණිකා හුදකලාව තංගල්ලේ පිහිටි සිර මැදිරිය අසලට ගොස් බබුන් පිළිබඳ මහල්ලෙකුගෙන් තතු විමසන අවස්ථාව -

- සීයෙ අර පෙනෙන්නේ හිර ගෙදරද?

  ඔව්, ඇයි ?

  එයා මේ හිර ගෙදර එව්වා

  ඒත් එයා ගමට ආවේ නෑ

  මම බොහොම දුර ඉඳලයි ආවේ

- ● කිසි දවසක ආවෙ නෑ එන්නෙත් නෑ උඹේ මිනිහාටත් ඒකමතමයි. දන් උඹ ආපසු පලයං
- ● හිරපල්ලා හා පුංචි මැණිකා අතර ඇති වන සංවාදය

මගෙ මිනිහා බලන්ඩ ආවා අය්යා

මොකක් ද එයා ගෙ නම

කොහෙද ගම

(ii) ★ කර්ලිනාහාමිගේ චරිතය නිරූපණය කරන කතුවරයා ඇගේ යථා තත්ත්වය කැලෑබඳ පරිසරය ඇසුරින් ධ්වනිත කරයි.

නිරිත දිග සුළඟට ඇඹර වී ඇටුවම් බැහී ගිය ගහක් මෙන් (උපමා) ඇගේ ශරීරය ද (උපමේය) නැමී ඇඹරී තිබිණ.

- ★ කුඹුක්ගස්වල පිටපොත්ත තැනින් තැන ඉගිලී සුදුව යන්නාක් මෙන් ඇගේ සමේද තැනින් තැන දුඹුරුවන් සුදු පුල්ලි නැගී තිබිණි.
- ★ ගැමිපරිසරයට උචිත පරිදි උපමා භාවිත කර ඇත.

පුංචි මැණිකාගේ කලබල තැති ගතියත්, සාන්ත බව හා යටහත් පහත් ගතියත් නිසා. " පුංචි මැණිකා මුවැත්තියක් වගේ " යයි අහිංසක ලෙස කියා ඇත.

නැතහොත්

(i) මහජන සෞඛ්‍යය පරීක්ෂකතුමා ගෙහිමියා අමතන්නේ ඔහුගේ රාජකාරි උණුසුම පෙන්වීමටත්, අරමුණ ඉටුකර ගැනීමටත් හැකි වන ලෙසය.

★ කවුද මේ ගෙදර ගෘහ මූලිකයා

කවුද මේ ගෙදර ලොක්කා

මේ ගෙදර වැසිකිළියක් තියනවා ද?

" සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනෑ........

මම ආයිමත් සුමාන දෙකකට පස්සේ එනවා.... එහෙම නොකළොත් උසාවි ගිහින් දඩකන්න වේවි."

★ කෝ කවුද හේරත් කියන්නේ?

වැසිකිළිය හැදුවද?

සුමාන දෙකකින් වැඩ ඉවර නොකළොත් බලාගත හැකි

කාටද වරදින්නේ කියලා.

(ii) ● අලුත් අවුරුද්දේ අලුත් පංතියට ගියවිට අපට ඉගැන්වූ විෂයයන් අතර සෞඛ්‍ය විද්‍යාව ද විය. විෂබීජ හා ක්ෂුද්‍ර ප්‍රාණීන් පිළිබඳ මෙහි උගන්වනු ලැබිණි. පාසලෙන් ලද සෞඛ්‍ය අධ්‍යාපනය වැසිකිළියේ ප්‍රථම පරිහරණකරු වීමේ භාග්‍ය හා ජයග්‍රහණය ලැබුවේ කථකයායි. ඔහු එය මල්ලීට කිව්වේ ය.

● "දැන් කවුරුන් කැලෑ ගානේ රිංගන්නේ නෑ. එයාට විතරක් මොක ද මමත් හෙට යනවා."

● තවත් කාලයක් යන තුරු ම පෙර සිරිත අනුගමනය කළ තාත්තා ද වැසිකිළිය ප්‍රයෝජනයට ගන්නට හුරුවිය.

05. ★ සරල ලිපිකරුවෙකු සමඟ විවාහ වීමට සිදු වූ ඇය නිතර මනෝලෝකයක ජීවත් වූවාය.

★ තමා ඉපිදී ඇත්තේ සියලු සුඛ විහරණ ආස්වාද කිරීමට ය යන සිතුවිල්ලේ පසු වූවාය.

★ ෆොරෙස්ටියර් මැතිණියගෙන් මාලයක් ණයට ඉල්ලා ගත්තාය.

★ බිත්තිවල එල්ලන ලද පෞරාණික මනුෂ්‍ය රූපසටහන්වලින් පිරුණු වාර්තාවන් තිර රෙදි ගැන කල්පනා කිරීම.

★ ඈ අනන්‍යයන් වශීකර ගැනීමටත් අනන්‍යයන් විසින් ප්‍රාර්ථනා කරනු ලැබීමටත් බෙහෙවින් ආශා කළාය.

06. " ඔය දූල දොඩමළුය - සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුළු කර - කෙසේ අතහැර යම්ද?
කෙකටියා පදුර..........

● කුඹුක් අතු වතුර අත ගගා නැමිලා දියට

● දිය කෙළින හැටි පුංචි මාළුවෝ දුටුවා ද?

● දෙවට දිග කරද වැල් ආරුක්කු යට සැඟව

● රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන

07. ● කවියා ප්‍රබල ධ්වනිතාර්ථවත් පද යොදා තිබීම

- "දෑතේ කර ගැට සිඬ සනසන්නට
ළා ගොයමේ දළු පවන් සලයි"

- අඩසඳ මෝරන මැදියම් අහසින්
බිලිඳු හදට කිරි දියර ගලයි.

- "හෙට ඉදිවන නව ලෝකය දැක දැක
පුංචි පුතා හීනෙන් හිනැහෙයි."

★ කවියා රූපකාර්ථවත් යෙදුම් යොදා තිබීම

★ දහදිය මුතු ඇට මල් වරුසා වී

★ එළිසමය භාවිතය ද යොදා තිබීම

★ අනුප්‍රාස භාවිතය

★ - හෙට ඉදිවන ලෝකය දැක දැක

★ සරලබස් වහර භාවිතය